# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 08/2015 (i)**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 මාර්තු මස 21 වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**විශේෂ ශ්‍රේණියට සහ I ශ්‍රේණියට උසස් කරන ලද උප-ශාලාධිපතිවරුන්ට නියමිත සේවා කාලය අඩු කිරීමේ ප්‍රතිලාභය ලබා දීම**

උප-ශාලාධිපති II,I ශ්‍රේණි සහ විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය පිළිබඳ වූ 2015.08.05 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2015 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2. අන්තර් විශ්වවිද්‍යාලීය උප-ශාලාධිපතිවරුන්ගේ සංගමය විසින් ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීම් කෙරෙහි අවධානය යොමු කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, 2016.02.26 දින පැවති සිය 935වන සභා වාරයේ දී කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2015 මඟින් කරන ලද නියමිත සේවා කාලය අඩු කිරීමේ ප්‍රතිලාභය විශේෂ ශ්‍රේණියේ සහ I ශ්‍රේණියේ උප-ශාලාධිපතිවරුන්ට පහත පරිදි ලබා දීමට තීරණය කරන ලදී;

**2.1 උප-ශාලාධිපති (විශේෂ ශ්‍රේණිය) සඳහා**

අ) කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2015 නිකුත් කිරීමට පෙර පැවති පැරණි පරිපාටිය යටතේ දැනටමත් උසස් කරන ලද උප-ශාලාධිපතිවරුන්ගේ (විශේෂ ශ්‍රේණිය) වැටුප් පියවර, ඔවුන් II සහ I ශ්‍රේණියේ ගත කරන ලද වසර 16කට වඩා වැඩි සේවා කාලය සඳහා වැටුප් වර්ධක හතරක් (04), උසස් වීම් දින සිට 2014.12.31 දක්වා කාලය සඳහා හිඟ මුදල් ගෙවීමකින් තොරව ලබා දීම මඟින්, උසස්වීම් දිනයේ සිට ගැළපීම.

ආ) 2015.01.01 දිනට II සහ I ශ්‍රේණියේ වසර 16කට වඩා වැඩි එහෙත් වසර 20කට වඩා අඩු සේවා කාලයක් ඇති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2015 ප්‍රකාරව උසස් කරන ලද උප-ශාලාධිපතිවරුන්ගේ (විශේෂ ශ්‍රේණිය) වැටුප් පියවර, වසර 16ට වඩා වැඩි සේවාව වෙනුවෙන් සෑම එක් වසරක් සඳහා එක් (01) වැටුප් වර්ධකය බැගින්, උසස් වීම් දින සිට 2014.12.31 දක්වා කාලය සඳහා හිඟ මුදල් ගෙවීමකින් තොරව ලබා දීම මඟින්, උසස්වීම් දිනයේ සිට ගැළපීම.

**2.2. උප-ශාලාධිපති (I ශ්‍රේණිය) සඳහා**

අ) කොමිෂන් සභා චක්‍රලේඛ අංක 08/2015 නිකුත් කිරීමට පෙර පැවති පැරණි පරිපාටිය යටතේ දැනටමත් උසස් කරන ලද I ශ්‍රේණියේ උප-ශාලාධිපතිවරුන්ගේ වැටුප් පියවර, ඔවුන් II ශ්‍රේණියේ ගත කරන ලද වසර 6කට වඩා වැඩි සේවා කාලය සඳහා එක් (01) වැටුප් වර්ධකයක්, උසස් වීම් දින සිට 2014.12.31 දක්වා කාලය සඳහා හිඟ මුදල් ගෙවීමකින් තොරව ලබා දීම මඟින්, උසස්වීම් දිනයේ සිට ගැළපීම.

*2 පිටුවට .....*

ආ) පැරණි පරිපාටිය යටතේ I ශ්‍රේණියට උසස් කරන ලද උප-ශාලාධිපතිවරුන්, නියමිත සේවා කාලයට වඩා අතිරේක එක් (01) වසරක් II ශ්‍රේණියේ ගත කර ඇති බැවින්, ඔවුන් I ශ්‍රේණියේ වසර 09ක සේවාවක් සම්පූර්ණ කිරීම මත ඊළඟ උසස් කිරීම වන විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සළකා බැලීම.

3. 2016 වර්ෂය සඳහා දැනටමත් වෙන් කර ඇති අරමුදල් මේ හා සම්බන්ධ වියදම් කළමනාකරණය කර ගැනීමට උසස් අධ්‍යාපන ආයතන / ආයතන වෙත නියම කෙරේ.

4. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා**
**සභාපති**

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසී/එච්ආර්/2/3/111/

ඊ/-